**IPRC/16/207**

# සාහිත්‍යය මූලාශ්‍රයවලින් හෙළිවන චතුරංගනී සේනාව පිළිබඳ අධ්‍යයනයක්. (අනුරාධපුර සහ පොළොන්නරු යුග ඇසුරින්)

ජීවන්ති හර්ෂණී[1*]

ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය පිළිබඳව අඛණ්ඩව තොරතුරු ලබාගැනීමේ දී සාහිත්‍යය මූලාශ්‍රය ඉතා වැදගත් වේ. සාහිත්‍යය මූලාශ්‍රය ගණයෙහිලා දේශීය මෙන්ම විදේශීය මූලාශ්‍රයන් දැක්විය හැකිය. සාහිත්‍යය මූලාශ්‍රයන්ගෙන් හෙළිවන ශ්‍රී ලාංකීය දේශපාලන ඉතිහාසය තුළ දැකිය හැකි වැදගත් අංශයක් වනුයේ චතුරංගනී සේනාවයි. එය ඇත්, අස්, රිය, පාබල යන සේනාංකයන්ගෙන් යුක්ත වේ. දේශපාලනික වශයෙන් ස්ථාවරත්වය පවත්වාගෙන යාමටත් ප්‍රදේශවල බලය තහවුරු කරගැනීමටත් ආක්‍රමණවලින් මිදීමටත් චතුරංගනී සේනාව වැදගත් වේ.

අනුරාධපුර හා පොළොන්නරු යුගයන්හි රජුන් සතුව චතුරංගනී සේනාවක් තිබුණේ ද යන්නත් එහි කාර්යය හා වැදගත්කම පිළිබඳවත් අනාවරණය කරගැනීම මෙම පර්යේෂණයේ අරමුණුයි. මෙහි දී ක්‍රමවේදය වශයෙන් පර්යේෂණ මාතෘකාවට අදාළ ප්‍රාථමික සාහිත්‍යය මූලාශ්‍රයන් ඔස්සේ කරුණු ඒකරාශී කරණු ලැබිණි. ලාංකික රජුන් සතුව පැවති සිවුරඟ සේනාව හෙවත් චතුරංගනී සේනාව පිළිබඳව ලාංකීය සාහිත්‍යය මූලාශ්‍රයවල ප්‍රධාන වශයෙන් කරුණු ඉස්මතු කර නොමැති වුව ද ඇතැම් රජුන්ගේ රාජ්‍ය කාලයන් විමසුමට ලක්කිරීමේ දී එම පාලකයන් සතුව චතුරංගනී සේනාවක් පැවති බව හෙළිකරගත හැකිය. නමුත් මහාවංසය යනාදී සාහිත්‍යය මූලාශ්‍රයවල බොහෝ අවස්ථාවල සඳහන් වනුයේ 'මහසෙන්', 'මහබල' යනුවෙනි. කෙසේවුවත් මෙරට පාලකයන් සතුව ප්‍රබල සිවුරඟ සේනාවක් සිටි බව ආක්‍රමණයන්ට මුහුණදෙමින් ලක්දිව එක්සේසත් කිරීම හා අභ්‍යන්තර සාමය පවත්වාගෙන යාම තුළින් හෙළිවේ.

චතුරංගනී සේනාව හා එහි කාර්යයභාරය පිළිබඳව කරුණු රැසක් භාරතීය රාජය පාලන මූලධර්ම අන්තර්ගත මූලාශ්‍රයක් වන අර්ථශාස්ත්‍රයෙහි වේ. පුරාණ යුගයේ පටන්ම මෙරට රජුන් සතුව චතුරංගනී සේනාවක් සිටි බව හෙළිවුව ද අර්ථශාස්ත්‍රයෙහි සඳහන් චතුරංගනී සේනාව පිළිබඳ ඇතැම් න්‍යායන්හි ආභාසය සිය සේනා සංවිධානයේ දී ලක් රජුන් ලබාගන්නට ඇතැයි ද අනුමාන කළ හැකිය.

සාහිත්‍යය මූලාශ්‍රයගත කරුණු කාරණාවලට අනුව අනුරාධපුර හා පොළොන්නරු යුගයන්හි ක්‍රියාත්මක වූ චතුරංගනී සේනාව ප්‍රබල තත්ත්වයක පැවතිය ද ඇතැම් අවස්ථාවල දී දුර්වල තත්ත්වයට පත්ව තිබූ බව පෙනීයයි. රාජ්‍යය අවධිවල පැවැත්ම උදෙසා චතුරංගනී සේනාව ඉතාමත් වැදගත් දේශපාලනික මූලිකාංගයක් බවට පත්ව තිබූ බව අනාවරණය කරගැනීම මින් අපේක්ෂිතය.

***ප්‍රමුඛ පදඃ*** *අනුරාධපුරය, පොළොන්නරුව, දේශපාලනය, චතුරංගනී සේනාව, සාහිත්‍යය මූලාශ්‍රය*

[1] කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව *nisansalaharshani200@gmail.com